රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 233

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1983 දෙසැම්බර් මස 28 දින.

සියලුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත ය.

අචිර තනතුරුවල වැඩ බැලීමට යොදන රජයේ
නිලධාරීන් ගේ සහ නැවත සේවයේ යොදවන
විශ්‍රාමිකයන් ගේ වැටුප් හා පාරිශ්‍රමිකයන්

කරුණාකර පහත සඳහන් කරුණු සටහන් කර ගන්න.

I. රජයේ සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවීමට හෝ අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමතිය ලබාගත යුතු ය.

II. වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට, හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවීමට හෝ යම් විශේෂ හේතු ඇති බවට අමාත්‍ය මණ්ඩලය සෑහීමට පත් වුවහොත් මිස එසේ නැවත සේවයේ යෙදවිය නොහැකි.

III. නිශ්චිත විධිවිධානයන් යටතේ රජයේ නිලධරයෙකුට අචිර තනතුරක පූර්ණ රාජකාරි ඉටු කිරීමට සිදුවන අවස්ථාවක හැර, රජයේ සේවයේ හෝ රජයේ සේවයේ සහ රාජ්‍ය සංස්ථාවක හෝ එක් තනතුරකට වැඩි තනතුරු දරන යම් තැනැත්තෙකු සියලු ම රාජකාරි කිරීම අවශ්‍ය වන්නේ නම් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාගත යුතු ය.

IV. පත්කිරීමේ බලධරයා අමාත්‍ය මණ්ඩලය වන අවස්ථාවන්හි දී හැර, තනතුරක් හිස් වීමෙන් දුරු කළ නොහැකි අපහසු හෝ තාවකාලික දුෂ්කරතාවලින් මිදීමට හෝ ඉහළ රාජකාරීවලට අචිරව තනතුරක වැඩ බැලීමට රජයේ නිලධරයෙකු පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගැනීම අවශ්‍ය නොවේ. එවැනි අවස්ථාවන්හි දී පාරිශ්‍රමිකයන් ගෙවීම සඳහා රීති ආයතන සංග්‍රහයේ සඳහන් ඇත.

V. වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසු රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යොදවනු ලබන හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යොදවනු ලබන හෝ, ඔහුට එක් දිනකින්, ඔහුගේ විශ්‍රාම වැටුපත් (දීමනා රහිතව) අතර ඔහු නැවත සේවයේ යොදා ඇති/සේවයේ යොදා ඇති, තනතුරේ දීමනා රහිත වැටුප හෝ අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති නිශ්චිත වැටුප යන දෙකින් අඩු එක අතර වෙනස පමණක් ගෙවිය යුතු ය. නැවත සේවයේ යොදවන්නන් ඔහු විශ්‍රාම යන්නට පෙර දැරූ තනතුරෙහි ම නම් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ලබමින් සිටි වැටුප ඔහුට ගෙවිය යුතු ය.

/...2

VI. වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම ගෙන ඇති පුද්ගලයෙකු නැවත සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති අවස්ථාවක දී ඔහුට ඉහත (V) දක්වා ඇති ආකාරයට ගෙවිය යුතු ය.

VII. තම නිත්‍ය තනතුරේ පූර්ණ රාජකාරියට අමතරව, තිබිය විධිවිධානයන් යටතේ අමතර තනතුරක පූර්ණ රාජකාරි ඉටුකරන රජයේ නිලධරයෙකුට ද, ඉහත (III) යටතේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති නිලධරයෙකුට ද, තම නිත්‍ය තනතුරේ දීමනා සහිත වැටුප ද, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව පූර්ණ රාජකාරි ඉටුකරන තනතුරේ දීමනා රහිත වැටුප ද ගෙවිය යුතු ය. එසේ වුවද, අමතර තනතුරේ පූර්ණ රාජකාරි ඉටුකිරීම සඳහා කෙරෙන ගෙවීම, එම අතිරේක තනතුරේ ආරම්භක වැටුපෙන් 1/4 කට සීමාවිය යුතු ය. වැටුපක් නියම කර නැති තනතුරක් සම්බන්ධයෙන් නම්, 1/4 ගණන් බැලිය යුත්තේ, භාණ්ඩාගාරයේ ලේකම් ගේ උපදෙස් ද ඇතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, ඉල්ලීමක් කළවිට, තීරණය කරන කල්පිත වැටුපෙන් ය.

02. 1982.05.31 දිනැති අංක. 197 (VII) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධනය කර ඇති ආයතන සංග්‍රහයේ VII වෙනි පරිච්ඡේදයේ 12:6 වගන්තියේ දැක්වෙන වැඩබැලීමේ වැටුප් පිළිබඳ සීමා ක්‍රියාත්මක නොවේ.

03. මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලින් උද්ගත වන පාරිශ්‍රමික වෙනස්වීම් ක්‍රියාත්මක වන්නේ 1984 ජනවාරි 1 වැනි දින සිට පමණි.

Siriwardhana

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.